භාරගත යුතුය. ඇතැම් ආයතන විසින් තම ආයතනයේ ඇති සියළුම වාහන පිළිබඳව තොරතුරු සඳහන් කර නොමැති බවට නාමිකව හා නිර්නාමිකව දැනුම්දීම් ලැබෙන අතර ඉදිරි ඡන්ද විමසීමේදී එවැනි තොරතුරක් ලද වහාම වගකිව යුතු නිලධාරියෙකු මගින් ඒ පිළිබඳව පරීක්ෂා කර බලා මැතිවරණ කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව සුදුසු පරිදි ක්‍රියා කිරීමට කටයුතු කරන බවද සඳහන් කරනු කැමැත්තෙමි.

12. ඡන්ද විමසීමේ රාජකාරි සඳහා යොදනු ලබන සියළුම රියදුරන්ට හා රිය ශෝධකයන්ට තැපැලෙන් ඡන්දය දීමේ පහසුකම් සලසා ගැනීමට හිමිකම් තිබේ.

13. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 (උ) ව්‍යවස්ථාවෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

14. මෙම ඡන්ද විමසීම සාර්ථක කර ගැනීම සඳහා ඔබ ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළු දෙනාගෙන් මැතිවරණ කොමිෂන් සභාවට ලැබෙන සහාය බෙහෙවින් අගය කොට සළකමි.

**සමන් ශ්‍රී රත්නායක,**
**මැතිවරණ කොමසාරිස් ජනරාල්,**
**මැතිවරණ කොමිෂන් සභාව**
**(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)**

පිටපත්:
1. ලේකම් - මැ.කො.ස - දැනගැනීම පිණිස හා නිසි කටයුතු සඳහා
2. සියළුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්/ දිස්ත්‍රික් ලේකම්වරුන්
3. සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්
4. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් - දැ.ගැ.පි

(2 - 4) දැ.ගැ.පි හා අ.ක.ස

5. පළාත් පාලන මැතිවරණ ශාඛාව

